## ඩිජිටල් සාක්ෂරතාවය වැඩසටහන - 2025

### හැඳින්වීම

පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වැඩිහිටියන්ට නව තාක්ෂණය පිළිබඳව අවබෝධයක් ලබා දීමත් අද පවතින නව තාක්ෂණයට යොමු කර සමාජීය තොරතුරු ලබා ගැනීමත් ආර්ථික වශයෙන් ඵලදායි ලෙස යම් ව්‍යාපාරයක් සඳහා අවශ්‍යතා ඇති වැඩිහිටියන් ඒ සඳහා යොමු වීමට හැකියාව ලබා දීමත් අපේක්ෂා කරයි. ඒ අනුව ජංගම දුරකථනයක් භාවිතා කිරීම ඒවායින් තොරතුරු ලබා ගැනීමත් බෙදාහැරීමත් හා ව්‍යාපාරික තොරතුරු බෙදා හැරීමටත් වැඩිහිටියා තුළ උනන්දුව ඇති කිරීමටද අපේක්ෂා කරයි. තවද වැඩිහිටියා අන්තර්ජාල හා සමාජ මාධ්‍ය ජාලා තුළ පවතින තොරතුරු දැන ගැනීම හා සමාජය වෙත තමන්ගේ අත්දැකීම් හා දැනුම මුදා හැරීමට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීමත් අපේක්ෂා කරයි. ඒ සඳහා 2011 අංක 05න් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතෙහි 13 වන වගන්තියේ උ හා ඌ ඡේදවලට අදාළවත් 2026 ක්‍රියාකාරී සැලැස්මට අනුව දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 75 ක් තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලබයි.

### අරමුණු

දිවයින පුරා විසිරී සිටින අඩු ආදායම්ලාභී වැඩිහිටියන්ට ස්වශක්තියෙන් නැගී සිටීමට අවස්ථාව උදාකර දීමට හා ඒ මගින් වැඩිහිටියා ඩිජිටල්කරණයට හුරු කිරීම අරමුණයි.

- ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳ දැනුම ලබාදීම තුළ වැඩිහිටියන්ට නව තාක්ෂණය සමඟ ගනුදෙනු කිරීමේ හැකියාව ලැබීම.
- මාර්ගගත ව්‍යාපාර (Online businesses) ක්‍රියාත්මක කිරීම තුළින් වැඩිහිටියන්ගේ ආර්ථිකය සවිමත් කිරීම.
- සමාජ මාධ්‍ය ජාලා තුළින් වැඩිහිටියන්ගේ දැනුම වර්තමාන සමාජය වෙත මුදා හැරීමත් සමග වර්තමාන සමාජය දැනුවත් කිරීම. (දේශීය හස්ත කර්මාන්තය, දේශීය ආහාර පිළිබඳ කෙටි වීඩියෝ ඉදිරිපත් කිරීම. )

### නිර්ණායක

- අවුරුදු 60 ට වැඩි වැඩිහිටියන් විය යුතුය.
- වැඩිහිටි දිවා මධ්‍යස්ථානවල හෝ වැඩිහිටි සමිතිවල සමාජිකයන් විය යුතුය.

### ක්‍රමවේදය

- ❖ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වැඩසටහන් එක බැගින් සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාවල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.
- ❖ වැඩසටහන සඳහා උපරිම රු . 75,000.00 ක මුදලක් ප්‍රාදේශීය ලේකම් වෙත ලබා දෙනු ලබයි.
- ❖ වැඩසටහන පැවැත්විය යුතු අවම කාලය පැය 06 ක් විය යුතු අතර,.වැඩසටහන පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කළ යුතුය.
- ❖ මෙම වැඩසටහන සඳහා වියදම් ඇස්තමේන්තුවක් ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිතව 2026.04.31 දිනට ප්‍රථම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.
- ❖ වැඩිහිටියන් 50 කු සඳහා අවශ්‍ය පහසුකම් සහිත ස්ථානයක් තෝරා ගත යුතුය.

- අන්තර්ජාල තාක්ෂණය, සමාජ මාධ්‍ය ජාලා මර්ගගත ව්‍යාපාර (Online businesses) පිළිබඳව හා ඩිජිටල් සාක්ෂරතා පුහුණුව

- ❖ සම්පත්දායක දීමනා ගෙවීමට රාජ්‍ය පරිපාලන හා කළමණාකරණ චක්‍ර ලේඛන අංක 07/2025 හා 2025.03.17 දිනැති චක්‍රලේඛයට අනුව ගෙවීම කළ යුතුය.
- ❖ මෙම වැඩසටහන ඔක්තෝම්බර් මාසය තුළ පවත්වා අවසන් කළ යුතුය.

අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු කිරීම

- ❖ මුදල් ලැබීම් කුවිතාන්සි පත (පොදු 172) මුදල් ලැබී දින 14 ක් ඇතුළත ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.
- ❖ වැඩසටහන පවත්වා අවසන් වූ වහාම ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය සහිත සවිස්තර වාර්තාව NSE/DEV/FO/ 002/I (ඇමුණුම 01) ආකෘතියට අනුව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

**<u>ඩිජිටල් සාක්ෂරතාවය ඉල්ලීම් ආකෘති පත්‍රය -2026</u>**

1. දිස්ත්‍රික්කය :- ..........................................................................................................
2. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ..........................................................................................................
3. පැවැත්වීමට අපේක්ෂිත දිනය :- ..........................................................................................................
4. සහභාගීත්වය

| අනු අංකය | ආයතනය | සහභාගි වන සංඛ්‍යාව |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

4.යෝජිත දළ ඇස්තමේන්තුව

| අනු අංකය | විස්තරය | ඇස්තමේන්තු ගත මුදල (රු) |
|---|---|---|
| 01 | සම්පත්දායක දීමනා | |
| 02 | සංග්‍රහ වියදම් | |
| 03 | වෙනත්<br>1.<br>2.<br>3 | |
| එකතුව | | |

සකස් කළේ :- .........................

විෂය භාර නිලධාරි
නිල මුද්‍රාව

නිර්දේශ කළේ :-.........................

සහකාර ප්‍රාදේශීය ලේකම්/
පරිපාලන නිලධාරි
නිල මුද්‍රාව

අනුමත කළේ :- .....................

ප්‍රාදේශීය ලේකම්
නිල මුද්‍රාව